**<u>කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරිපිටදීය.</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු ගරු ආදිත්‍ය පටබැඳිගේ මැතිතුමා (සභාපති)</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු ගරු මංජුල තිලකරත්න මැතිතුමා</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු ගරු එම්.ඩබ්.ජේ.කේ.වීරමන් මැතිතුමා</u>**

**<u>නඩු අංකය : HC(TAB)3887/22</u>** **<u>දිනය : 2023.04.06</u>**

**සටහන් ගැනීම ල/ලේ මධුෂානි කරුණාරත්න මිය සහ ල/ලේ ඉරේෂා මෙය විසිනි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**-පැමිණිල්ල -**

1. **ජයකොඩි අරච්චිගේ අනුර චමින්ද අප්පුහාමි**
2. **තවරාසා සුදාකරන්**
3. **අග්ලේස පිල්ලේ තවරාසා**
4. **යද්දෙහි ආරච්චිගේ ලසන්ත ප්‍රියලාල්**
5. **කන්දයියා චන්ද්‍රකුමාර්**

**-චූදිතයන්-**

# <u>තීන්දුව</u>

ශ්‍රී ලංකා ජනරජයේ නීතිපතිවරයා විසින් චූදිතයන්ට එරෙහිව පහත සඳහන් චෝදනා තුන මත අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කරන ලදී.

**1. වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 21 වෙනි දින හෝ ඊට ආසන්න දිනයකදී ජාත්‍යන්තර මුහුදු සීමාවේ දී ශ්‍රී ලාංකිකයින් වන යුෂ්මතුන් 1984 අංක**

13 දරණ විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතින් සංශෝධිත විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥා පනතේ 54 අ(ඇ) වගන්තියේ සඳහන් පරිදි එකී ආඥා පනතේ තුන්වන උපලේඛනයේ III වන කොටසේ II තීරයේ දක්වා ඇති අන්තරාදායක ඖෂධයක් එනම්, ඩයිඇසටයිල් මෝර්ෆීන් හෙවත් හෙරොයින් එකී ආඥා පනතේ V වන පරිච්ඡේදයේ විධිවිධාන වලින් අවසර දී ඇති පරිදි හැර හෝ එකී විධිවිධානවලට ඇනුකූල නොවන ආකාරයකින් නැතහොත් අධ්‍යක්ෂකවරයාගේ බලපත්‍රයකින් අවසර දී ඇති පරිදි හැර හෝ ඊට අනුකූල නොවන ආකාරයකින් එකී II තීරයේ දක්වා ඇති ප්‍රමාණය ඉක්මවා එනම්, කිලෝ ග්‍රෑම් 196 යි ග්‍රෑම් 986 ක ප්‍රමාණයක් ආනයනය කිරීමෙන් එකී ආඥා පනතට විරුද්ධ වූ වරදකට වරදකරුවන් වන බැවින්, 1981 අංක 71 දරණ පනතින් සංශෝධිත 1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනතේ 9(1) (ඉ), 9(1)(ඊ) සහ 17 වන වගන්ති සමග කියවිය යුතු සංශෝධිත විෂ වර්ග අබිං සහ අන්තරාදායක ඖෂද වර්ග ආඥා පනතේ තුන්වන කොටසේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු වරදක් කළ බවය.

2. ඉහත කී වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියා කලාපයේදීම ශ්‍රී ලාංකිකයන් වන යුෂ්මතුන් 1984 අංක 13 දරණ විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතින් සංශෝධිත විෂ වර්ග,

අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥා පනතේ 54 අ.(ඇ) වගන්තියේ සඳහන් පරිදි එකී ආඥා පනතේ තුන්වන උපලේඛනයේ III වන කොටසේ II තීරයේ දක්වා ඇති අන්තරාදායක ඖෂධයක් එනම්, ඩයිඇසටයිල් මෝර්ෆීන් හෙවත් හෙරොයින් එකී ආඥා පනතේ V වන පරිච්ඡේදයේ විධිවිධාන වලින් අවසර දී ඇති පරිදි හැර හෝ එකී විධිවිධානවලට ඇනුකූල නොවන ආකාරයකින් නැතහොත් අධ්‍යක්ෂකවරයාගේ බලපත්‍රයකින් අවසර දී ඇති පරිදි හැර හෝ ඊට අනුකූල නොවන ආකාරයකින් එකී II තීරයේ දක්වා ඇති ප්‍රමාණය ඉක්මවා එනම්, කිලෝ ග්‍රෑම් 196 යි ග්‍රෑම් 986 ක ප්‍රමාණයක් සන්තකයේ තබා ගැනීමෙන් එකී ආඥා පනතට විරුද්ධ වූ වරදකට වරදකරුවන් වන බැවින්, 1981 අංක 71 දරණ පනතින් සංශෝධිත 1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනතේ 9(1)(ඉ), 9(1)(ඊ) සහ 17 වන වගන්ති සමග කියවිය යුතු සංශෝධිත විෂ වර්ග අබිං සහ අන්තරාදායක ඖෂද වර්ග ආඥා පනතේ තුන්වන කොටසේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු වරදක් කළ බවය.

3. ඉහත කී වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියා කලාපයේදීම ශ්‍රී ලාංකිකයන් වන යුෂ්මතුන් 1984 අංක 13 දරණ විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතින් සංශෝධිත විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥා පනතේ 54 අ.(ආ) වගන්තියේ සඳහන් පරිදි එකී ආඥා පනතේ තුන්වන උපලේඛනයේ III

**වන කොටසේ II තීරයේ දක්වා ඇති අන්තරාදායක ඖෂධයක් එනම්, ඩයිඇසටයිල් මෝර්ෆීන් හෙවත් හෙරොයින් එකී ආඥා පනතේ V වන පරිච්ඡේදයේ විධිවිධාන වලින් අවසර දී ඇති පරිදි හැර හෝ එකී විධිවිධානවලට ඇනුකූල නොවන ආකාරයකින් නැතහොත් අධ්‍යක්ෂකවරයාගේ බලපත්‍රයකින් අවසර දී ඇති පරිදි හැර හෝ ඊට අනුකූල නොවන ආකාරයකින් එකී II තීරයේ දක්වා ඇති ප්‍රමාණය ඉක්මවා එනම්, කිලෝ ග්‍රෑම් 196 යි ග්‍රෑම් 986 ක ප්‍රමාණයක් ජාවාරම් කිරීමෙන් එකී ආඥා පනතට විරුද්ධ වූ වරදකට වරදකරුවන් වන බැවින්, 1981 අංක 71 දරණ පනතින් සංශෝධිත 1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනතේ 9(1)(ඉ), 9(1)(ඊ) සහ 17 වන වගන්ති සමග කියවිය යුතු සංශෝධිත විෂ වර්ග අබිං සහ අන්තරාදායක ඖෂද වර්ග ආඥා පනතේ තුන්වන කොටසේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු වරදක් කළ බවය.**

## 1. <u>හැඳින්වීම</u>

1.1 වූදිතයන්ට චෝදනාවන් කියවා දුන් අතර ඔවුන් එකී චෝදනාවන්ට වෙන් වෙන් වශයෙන් නිවැරදිකරුවන් බව පවසන ලදී.

1.2 පැමිණිල්ල වෙනුවෙන් නාවික හමුදා කපිතාන් අනිල් බෝවත්ත, ධීවර නිලධාරී ප්‍රසන්න ප්‍රේමවර්ධන, විශ්‍රාමික නාවික හමුදාපති පියල් සිල්වා, ධීවර හා ජල සම්පත් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක මාපලගම මානගේ ආරියරත්න, නියෝජ්‍ය පොලිස්පති සජීව මැදවත්ත, ප්‍රධාන පොලිස් පරීක්ෂක

චන්ද්‍රසිරි හිරියාදෙනිය, නාවික හමුදා කමාන්ඩර් නිශාන්ත දහනායක, ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක චන්ද්‍රමාලි කොඩිතුවක්කු, හිටපු පොලිස් සැරයන් සමීර ධනුෂ්ක, නාවික හමුදා කමාන්ඩර් ජයසූරිය, ප්‍රධාන පොලිස් පරීක්ෂක තාරක සුබෝධ, රජයේ මිනින්දෝරු අශෝකා පුෂ්පකාන්ති, පොලිස් සැරයන් පද්මසිරි රත්නායක සහ නාවික හමුදාවේ පද්මකුමාර ජයවර්ධන යන සාක්ෂිකරුවන් සාක්ෂි දී ඇත.

1.3 පැමිණිල්ල අවසන් කිරීමෙන් පසු අධිකරණය විසින් චිත්ති වාචක කැඳවීමට තීරණය කර ඔවුන්ගේ අයිතිවාසිකම් පහදා දෙන ලදී. ඒ අනුව 1 වන චූදිත සාක්ෂි දුන් අතර ඔහු වෙනුවෙන් උප පොලිස් පරීක්ෂක ලසන්ත ගුණසේකර සහ නාවික නැව් ප්‍රභාත් සමීර යන සාක්ෂිකරුවන් සාක්ෂි දෙන ලදී. 2, 3, 4, 5 චූදිතයන් චිත්තිකූඩුවේ සිට ප්‍රකාශ කළ අතර ඔවුන් වෙනුවෙන් කිසිදු සාක්ෂිකරුවෙක් නොකැඳ වන ලදී.

1.4 ඉන් අනතුරුව පැමිණිල්ල විසින් බිඳ හෙළීමේ සාක්ෂි ලෙස වෛද්‍ය කුමුදු කුමාරි ජුසාර්, වෛද්‍ය අනුර සේනානායක සහ වෛද්‍ය නිමල්ක පෙරේරා යන සාක්ෂිකරුවන් කැඳවන ලදී.

1.5 නඩු විභාගයේදී ඉදිරිපත් වූ සාක්ෂි අප විසින් සැලකිල්ලෙන් සලකා බලන ලදී. එබැවින් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සාරාංශගත කරමින් නැවත මෙම තීන්දුවේ දීර්ඝ ලෙස සඳහන් කිරීමට අපි අදහස් නොකරමු. අප බලාපොරොත්තු වන්නේ එක් එක් සාක්ෂිකරුගේ සාක්ෂිය සමස්තයක් ලෙස සලකමින් විශ්ලේෂණය කර සුදුසු නිගමනයන්ට එළඹීමටයි.

## 2. <u>සාක්ෂි විශ්ලේෂණයේදී සළකා බැලිය යුතු නීතිමය සිද්ධාන්ත</u>

2.1 නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අධිචෝදනා පත්‍රයේ සඳහන් චෝදනා තුන සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමේ භාරය පැමිණිල්ල සතු වේ. එහිදී විත්තියට කිසිදු ඔප්පු කිරීමේ භාරයක් නොපැවරෙන අතර පැමිණිල්ලේ සාක්ෂි සම්බන්ධයෙන් සාධාරණ සැකයක් ජනිත කිරීම පමණක් ප්‍රමාණවත් වේ. එසේම විත්තිවාචකයේ සඳහන් දුර්වලතා නොසළකා ඉදිරිපත් කර ඇති චෝදනා ඔප්පු කිරීමේ භාරය සහමුලින්ම පැමිණිල්ල මත රඳා පවතී. එසේම නඩු විභාගයේදී චූදිතයින්ට නිහඬව සිටීමේ අයිතියක්ද ඇති අතර පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව අදාළ චෝදනා ඔප්පු කරනතෙක් චූදිතයින් සතුව නිර්දෝෂී භාවයේ පූර්ව නිගමනයේ රැකවරණය හිමි වේ.

2.2 පැමිණිල්ල විසින් චෝදනා සම්බන්ධයෙන් ප්‍රබල සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් විත්තිවාචක කැඳවීමකින් තොරව වුවද විත්තිකරුවන් නිදොස් කළ යුතුවේ. පැමිණිල්ල ප්‍රබල නඩුවක් ගොඩනගා ඇති බවට අධිකරණයට ඒත්තු යන අවස්ථාවකදී විත්තියේ සාක්ෂි සළකා බලනු ලැබේ. මෙම නඩුවේ දී පළවන චූදිත දිවුරුම්පිට සාක්ෂි දී තවත් සාක්ෂිකරුවන් දෙදෙනෙකු කැඳවන ලද අතර සෙසු චූදිතයින් විත්තිකූඩුවේ සිට ප්‍රකාශයන් කරන ලදී. එමගින් යම් සාධාරණ සැකයක් පැමිණිල්ලේ නඩුව කෙරෙහි ඇති කරන්නේ නම් හෝ චූදිතයින්ගේ ප්‍රකාශ ප්‍රතික්ෂේප කිරීමට අධිකරණයට නොහැකි වන අවස්ථාවකදීද, එහි වාසිය විත්තියට ලබාදිය යුතු වේ.

2.3 අපරාධ නඩුවක ඉදිරිපත් වී ඇති සාක්ෂි සළකා බැලීමේදී අධිකරණය විසින් එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවල පිළිගතහැකි භාවය, සාක්ෂිදීමේ විලාශය,

අප්‍රමාදීත්වය, ඒකාකාරී භාවය සහ වියහැකි භාවය ඇතුළු නිර්ණායකයන් යොදාගනු ලැබේ.

2.4 ඒ අනුව සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මත පරස්පරතාවයන් ලකුණු කර තිබීම හෝ ඌනතාවයන් පෙන්වා සිටින අවස්ථාවකදී ඒවා කෙතරම් දුරට නඩුවේ හරයට බලපාන්නේද යන්න සම්බන්ධයෙන් සුපරික්ෂාකාරීව සළකාබැලිය යුතුය.

2.5 අනෙක්අතට සාක්ෂි විශ්ලේෂණය කිරීමේදී සෑම සාක්ෂිකරුවෙකුම සාමාන්‍ය මිනිසුන් බවද, මිනිසුන් සතු සහජ දුර්වලතාවයන්ද ඒ තුළ ගැබ්විය හැකි බවට සිත්හි තබාගත යුතුය. ඔවුන්ගේ සාක්ෂි යාන්ත්‍රිකව පටිගත කරන ලද සිද්ධියක් නැවත ප්‍රතිනිර්මාණය කරන්නාක් මෙන් ඒකාකාරී සාක්ෂියක් බලාපොරොත්තු විය නොහැකිය. එබැවින් සාමාන්‍ය මිනිසුන්ට සිදු වන අමතකවීම්, අතපසුවීම් මෙන්ම ඒවා දරාගැනීමට ඇති ශක්තිය සහ සාක්ෂිකරුවන්ගේ බුද්ධි මට්ටම, අධ්‍යාපනය, සමාජීය තරාතිරම වැනි කරුණු අනුව පුළුල්ව සළකාබැලිය යුතු වේ.

ඉහත සඳහන් මූලික සිද්ධාන්තයන් කෙරෙහි අධිකරණයෙහි සිත් යොමු කරමින් ඉදිරිපත් වී ඇති සාක්ෂි විශ්ලේෂණය කරමු.

**3. <u>පැමිණිල්ලේ නඩුව සැකෙවින්</u>**

3.1 මෙම වැටලීමට අදාල මුල් තොරතුර ලැබී ඇත්තේ එවකට පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් කටයුතු කරන ලද පැමිණිල්ලේ සාක්ෂි අංක 31 සජීව මැදවත්ත මහතාට වේ. 2019.04.14 වන

දින රාජ්‍ය බුද්ධි අංශයෙන් ලද තොරතුර අනුව 2019.04.08 වන දින මීගමුව ප්‍රදේශයෙන් මුහුදු ගිය බහුදින ධීවර යාත්‍රාවක් මත් ද්‍රව්‍ය කිලෝ 200 කට ආසන්න ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට රැගෙන ඒමට සූදානමක් ඇති බවට රාජ්‍ය බුද්ධි සේවාවෙන් දැනුම් දී ඇත. එම ධීවර යත්‍රාවේ නම පූජා 2 බවද, අංකය MULA 727 බවටද සඳහන් කර ඇත. එසේම මෙම යාත්‍රාව නැවත වාලච්චේන මුහුදු තීරයට පැමිණීමට නියමිත බවටද සඳහන් කර ඇත.

3.2 සාක්ෂිකරුට අනුව මෙය බුද්ධි තොරතුරක් නොවන හෙයින් හා එය හුදු තොරතුරක් පමණක් වන හෙයින් මෙම තොරතුර වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට දැනුම් දී ඇත. එහිදී සාක්ෂිකරු බලාපොරොත්තු වී ඇත්තේ ධීවර යාත්‍රාවේ නම සහ අංකය තහවුරු කර ගැනීම මෙන්ම එකී යාත්‍රාව සාගරයේ යාත්‍රා කරන ග්‍රිඩ් අංකය සොයා ගැනීම වේ.

3.3 මේ සම්බන්ධයෙන් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට මෙන්ම ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධටද වගකීම 2019.04.15 වන දින පවරා ඇත.

3.4 ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධ මේ සම්බන්ධයෙන් තොරතුරුකරුවන්ගෙන් ලද තොරතුරු අනුව සාක්ෂිකරුට දැනුම් දී ඇත්තේ පූජා 2 හා අංක 727 දරණ ධීවර යාත්‍රාව මාස දෙකක කාලයක පටන් ත්‍රිකුණාමලය වරායේ නැංගුරම්ලා ඇති බවයි.

3.5 මෙකී තත්ත්වය සාක්ෂිකරු විසින් රාජ්‍ය බුද්ධි සේවයට නැවත දැනුම් දී ඇත. එසේම සාක්ෂිකරු 2019.04.16 වන දින රාජ්‍ය බුද්ධි සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු හමු වීමට මත්ද්‍රව්‍ය කාර්යංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට උපදෙස් ලබා දී ඇත.

3.6 නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා සාක්ෂිකරුට දැනුම් දී ඇත්තේ ධීවර යාත්‍රාවේ අංකය 0299 හා නම ශාන්ත අන්තෝනි බවයි. සාක්ෂිකරුට ඉහත කී යාත්‍රාවේ Departure Card එක සම්බන්ධයෙන් තොරතුරුද, එම යාත්‍රාව තුළ පස්දෙනෙකු සිටින බවටද දැන ගැනීමට ලැබී ඇති අතර එම යාත්‍රාව තුළ සිටින එක් අයෙකු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර ඇත.

3.7 ඉන්පසු මේ පිළිබඳව රහස්‍ය වාර්තාවක් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට තීරණය කර ඇති අතර ඒ අනුව පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ගොස් රහස්‍ය වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

3.8 මේ සම්බන්ධයෙන් සාක්ෂිකරු නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධ සමග සාකච්ඡා කර ඇති අතර ඒ අනුව ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධ විසින් ඔහුගේ තොරතුරුකරු සමග සාක්ෂිකරුට සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දී ඇති අතර ඒ අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී සාක්ෂිකරු ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධ, උප පොලිස් පරීක්ෂක උදාර සමග එකී තොරතුරුකරු මුණගැසී ඇත.

3.9 2019.04.19 වන දින රාත්‍රියේ ලද තොරතුරක් අනුව මෙම ධීවර යාත්‍රාව නැගෙනහිර ඊශාන මුහුදු තීරයේ නවතා තිබෙන බව සහ ඉදිරි දින කිහිපය තුළ ශ්‍රී ලංකාව දෙසට පැමිණීමට නියමිත බව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධ විසින් සාක්ෂිකරුට දැනුම් දී ඇත. මෙම තොරතුරෙහි විශ්වාසනීයත්වය පිළිබඳව තහවුරු වූ හෙයින් 2019.04.20 සවස් වරුවේ සාක්ෂිකරු පොලිස්පතිවරයා ඔහුගේ නිල නිවසේදී මුණගැසී දැනුවත් කර ඇත.

3.10 පොලිස්පතිවරයා මේ පිළිබඳව එවකට නාවික හමුදාපති වශයෙන් කටයුතු කල පියල් ද සිල්වා සමග සාකච්ඡා කර ඇති අතර මේ සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට සාක්ෂිකරුට උපදෙස් දී ඇත. සාක්ෂිකරු එකී උපදෙස් මත නාවික හමුදාපතිවරයාට විස්තර කර ඇති අතර නාවික හමුදාපතිවරයා විසින් මෙකී මෙහෙයුම දියත් කිරීම සඳහා තවත් විස්තර ඉල්ලා ඇත.

3.11 2019.04.20 රාත්‍රියේ 8.30 ට, 9.00 ට පමණ සාක්ෂිකරුට ලද ග්‍රිඩ් අංකය නාවික හමුදාපතිවරයාට ලබා දී ඇත. එසේම මෙම ධීවර යාත්‍රාව 2019.04.21 දින රාත්‍රී 9.00 ත්, 11.00 ත් අතර ඉන්දීය යාත්‍රාවකට මත්ද්‍රව්‍ය තොගය ලබාදීමේ සූදානමක් ඇති බවට ලද තොරතුර 2019.04.20 රාත්‍රී 8.30 ත්, 9.00 ත් අතර නාවික හමුදාපතිවරයාට දැනුම් දී ඇත.

3.12 ඒ අනුව නාවික හමුදාපතිවරයා සාක්ෂිකරුට දැනුම් දී ඇත්තේ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු 2019.04.21 අළුයම 5.00 වන විට ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරට යොමු කරන ලෙසයි.

3.13 නමුත් විනාඩි 15 කින් පමණ නැවත නාවික හමුදාපතිවරයා සාක්ෂිකරුට පවසා ඇත්තේ ගොඩබිමෙන් නාවික යාත්‍රාවක් යොමු කිරීම ප්‍රායෝගික නොවන හෙයින් දැනට සාගරයේ යාත්‍රා කරමින් තිබෙන නාවික යාත්‍රාවක් මෙම කර්තව්‍ය සඳහා යොමු කරන බවයි.

3.14 2019.04.22 උදෑසන ප්‍රශ්නගත ධීවර යාත්‍රාව සහ පුද්ගලයන් පස්දෙනෙකු නාවික හමුදාව විසින් භාරයට ගෙන ඇති බව නාවික හමුදාවෙන් සාක්ෂිකරුට දැන ගැනීමට ලැබී ඇත. (2022.10.13 පස්වරු 3.20 විභාග සටහනේ දෙවන පිටුව)

3.15 මෙම තත්ත්වය සාක්ෂිකරු විසින් පොලිස්පතිවරයා, ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධ හා උප පොලිස් පරීක්ෂක උදාර යන නිලධාරීන්ටද දැනුම් දී ඇත.

3.16 එසේම මෙම මෙහෙයුම සිදුකල නාවික යාත්‍රාව සහ ඔවුන් භාරයට ගත් ධීවර යාත්‍රාව සහ සැකකරුවන් සමග 2014.04.23 වන දින ත්‍රිකුණාමල වරායට පැමිණෙන බවට සාක්ෂිකරුට ලද දැනුම් දීම මත පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ස්ථානාධිපති හිරියාදෙණිය සහ නිලධාරීන් පිරිසක් ත්‍රිකුණාමලය වරාය වෙත යොමු කිරීමට පියවර ගෙන ඇත.

3.17 එසේම සුබෝධ සහ උදාර යන නිලධාරීන්ටද ත්‍රිකුණාමලයට පැමිණෙන ලෙසට දැනුම් දී ඇත. එසේම සාක්ෂිකරුද පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ අධ්‍යක්ෂකවරයාද මේ සඳහා සහභාගි වීමට තීරණය කර ත්‍රිකුණාමලය ප්‍රදේශයට ගොස් ඇත.

3.18 ඒ අනුව 2019.04.23 වන දින අළුයම 08.30 ට පමණ සාක්ෂිකරු ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරට ගොස් ඇත. එම ස්ථානයේදී ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය, සුබෝධ සහ උදාර යන නිලධාරීන් සහ මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ නිලධාරීන් කිහිපදෙනෙකු ඔහුට මුණ ගැසී ඇත. එසේම පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා සහ රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරියෙකු සහභාගී වී ඇත. එම පිරිස පරීක්ෂාවට ලක්වීමෙන් පසු මෙහෙයුමට සම්බන්ධ නෞකාව වෙත ඔවුන් රැගෙන ගොස් ඇත.

3.19 නෞකාවට ඇතුළුවීමට පෙර සියලුම නිලධාරීන් ශරීර පරීක්ෂාවටද ඔවුන් සතුව තිබූ බඩු භාණ්ඩද පරීක්ෂා කර එකී නෞකාවේ ඩෙක් එක නමැති කොටසට රැගෙන ගොස් ඇත. නෞකාවට ගොඩ වූ පසු සාක්ෂිකරුට පැමිණිල්ලේ සාක්ෂි අංක 02 බෝවත්ත මහතා මුණ ගැසී ඇත. ඔහු විසින් සිදුවූ සිද්ධිය කෙටියෙන් විස්තර කර ඇත.

3.20 එම ස්ථානයේ සිට හෙලි පැඩ් නමැති කොටසට යන විට එම ස්ථානයේ පාර්සල් ප්‍රමාණයක් ගොඩ ගසා තිබී ඇති අතර සිවිල් පුද්ගලයන් පස්දෙනෙකුද සිට ඇත. එම පුද්ගලයන් පස්දෙනා මෙම නඩුවේ චූදිතයන් බවත්, නම් වශයෙන් හඳුනාගැනීමට නොහැකි බවත් පවසන ලදී.

3.21 එම ස්ථානයේ තිබූ ගෝනි තොගය අවර්ණ සුදු පැහැති ඒවා බවද, එක් කහ පාට බෑගයක් තිබුණ බවද පවසන ලදී. එම ස්ථානයේ බෑග් 13 ක් තිබුණ බව සහ බෑග් දෙකක කට ගැට ගසා නොතිබුණ බවද පවසන ලදී.

3.22 එකී බෑග් 13 සහ චූදිතයන් පස්දෙනා බෝවත්ත නිලධාරියා විසින් සාක්ෂිකරුට භාර දී ඇති අතර සාක්ෂිකරු විසින් එකී ගෝනි සහ පුද්ගලයන් ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියට භාරදුන් බව පවසන ලදී.

3.23 ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය P 1 සිට P 13 දක්වා එකී බෑග් ලකුණු කර ඇත. එකී එක් බෑගයක් තුල අඟල් 10 X10 ප්‍රමාණයේ පාර්සල් තිබී ඇති අතර, ඒ එක් එක් බෑගය පොලිතින් උරයකින් ආවරණය කර ඊට යටින්ද තවත් පොලිතින් උරයක්ද තිබුණ බව පවසන ලදී. එම සොලෝෆේන් කවරය මැදින් නිල් හා දම් පාට වැනි මුද්‍රාවක් තිබී ඇත.

3.24 එම අවස්ථාවේදී ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය එක් පැකට්ටුවක් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර ඇති අතර, ඒ අනුව ඒ තුල හෙරොයින් තිබෙන බවට නිරීක්ෂණය වූ හෙයින් එම ස්ථානයේ සිටි සිවිල් පුද්ගලයන් පස්දෙනාට මත්ද්‍රව්‍ය ජාවාරම, ප්‍රවාහනය සහ සන්තකය යන චෝදනාවන් කියවා දී අත්අඩංගුවට ගත් බව පවසන ලදී.

3.25 චූදිතයන් සහ පොලිසැක් උර 13 නිවැරදි ලෙස භාරගත් බවට සනාථ කරමින් පැ.6 දරන ලේඛනය අත්සන් කල බව සාක්ෂිකරු පවසයි.

3.26 P1 පැකට්ටුව තුල පාර්සල් 20 ක් තිබී ඇත. එම සෑම පැකට්ටුවකම බර කිරා සටහන් කර ඇති අතර උර 12 ක පැකට් 20 බැගින්ද, එක් උරයක පැකට් 8 ක් බැගින් පැකට් 248 ක් තිබුණු බව පවසන ලදී. එකී පැකට්ටුවල සමස්ත බර ප්‍රමාණය කිලෝ 273.19 ක් බව පවසන ලදී.

3.27 ඉන්පසු සාක්ෂිකරු නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා සහ සෙසු නිලධාරීන් (ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය හැර) ධීවර යාත්‍රාව නිරීක්ෂණයට ගිය බව පවසන ලදී. ධීවර යාත්‍රාව තුල තිබූ එන්ජින් රූම් එක, අයිස් රූම් එක පරීක්ෂා කල බවද , ධීවරයන් නැවතී සිටි කොටසේ ඇඳන් 4 ක්, 5 ක් තිබුණ බවද, මාළු සහ දැල් තිබුණ බව පවසන ලදී.

3.28 නැවත වතාවක් සාක්ෂිකරු නාවික යාත්‍රාවට යන විට සියලුම පාර්සල් වෙනත් සුදු පැහැති බෑග් 13 කට ඇතුළත් කර P 1 සිට P 13 දක්වා ලකුණු කර තිබූ බව පවසන ලදී. එසේම ඒවා මුද්‍රා තබා තිබූ බවද සාක්ෂිකරු නිරීක්ෂණය කර ඇත.

3.29 ඉන්පසු නාවික හමුදාව සමග සාකච්ඡා කර නාවික හමුදාවේ වාහනවලින් සහ ඔවුන්ගේ ආරක්ෂාව සහිතව නඩු භාණ්ඩ සහ චූදිතයන් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වෙත රැගෙන ඒමට පියවර ගත් බව පවසන ලදී.

## 4. විත්තියේ නඩුව සැකෙවින්

4.1 1 වන චූදිතගේ සාක්ෂියේ හරය වන්නේ තමා නියමුවා ලෙස ක්‍රියා කල ධීවර යාත්‍රාව තුළ කිසිදු නීති විරෝධී ද්‍රව්‍යයක් නොතිබූ බවත්, නාවික හමුදා නිලධාරීන් තමා සහ තම යාත්‍රාව තුළ සිටි අනෙක් චූදිතයන් අත්අඩංගුවට ගත් බවත්ය. මෙම චූදිත වෙනුවෙන් සාක්ෂිකරුවන්ට යෝජනා කල ස්ථාවරය සම්බන්ධයෙන් මෙම තීන්දුවේ පසුව සඳහන් කිරීමට අදහස් කරමු.

4.2 2 වන චූදිත සිය විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේ සඳහන් කලේ තමා ධීවර යාත්‍රාව තුළ නිදා සිටියදී බෝට්ටු දෙකකින් පැමිණි නාවික හමුදා නිලධාරීන් තමාට පහර දුන් බවත්, තමා කිසිදු නීති විරෝධී ක්‍රියාවක් නොකල බවත්ය.

4.3 3 වන චූදිත සිය විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේ සඳහන් කලේ තමා ගමන් කල ධීවර යාත්‍රාවේ කිසිදු නීති විරෝධී දෙයක් නොතිබූ බවයි. 3 වන චූදිත වෙනුවෙන් සාක්ෂිකරුවන්ට කල යෝජනාව සම්බන්ධයෙන්ද මෙම තීන්දුවේ පසුව සඳහන් කිරීමට බලාපොරොත්තු වෙමු.

4.4 4 වන චූදිත විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේදී ගත් ස්ථාවරය වූයේ තමා රැකියාව ලෙස ධීවර රැකියාව කරන බවත්, තමාට මෙම ධීවර යාත්‍රාවේ කටයුතු පිළිබඳව කිසිදු පාලනයක් නොතිබූ බවත්, අදාල මත් ද්‍රව්‍ය තොගය සහ තමා අතර කිසිදු සම්බන්ධයෙන් නොමැති බවත්ය.

4.5 5 වන චූදිත සිය විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ තමා මෙම ධීවර යාත්‍රාවේ ඉවුම් පිහිම් කටයුතු සඳහා සම්බන්ධ වූ බවත්, නාවික හමුදා නිලධාරීන් විසින් තමා අල්ලා ගත් බවත්, තමා කිසිදු නීති විරෝධී කටයුත්තකට සහභාගි නොවූ බවත්ය.

## 5. <u>සාක්ෂි විශ්ලේෂණය</u>

### 5.1 <u>වැටලීමට අදාල මුල් තොරතුර ලැබීම, නඩු භාණ්ඩ හා චූදිතයන් අත්අඩංගුවට ගැනීම</u>

5.1.1 මෙම නඩුවේ චූදිතයන් පස්දෙනාම 2019.04.21 වන දින නාවික හමුදාව විසින් ජාත්‍යන්තර මුහුදු සීමාවේදී ධීවර යාත්‍රාවක් තුළ සිටියදී භාරයට ගෙන ඇති බව අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 420 වගන්තිය යටතේ පිළිගන්නා ලදී.

5.1.2 මෙම වැටලීමට අදාල මුල් තොරතුර ලැබී ඇත්තේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය භාර නියෝජ්‍ය පොලිස්පති මැදවත්ත එනම්, පැ.සා.31 ට වේ. ඔහු

මෙසේ ලද තොරතුරු වර්ධනය කරගැනීම සඳහා භාරදී ඇත්තේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට සහ පැමිණිල්ලේ සාක්ෂි අංක 4 ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධට වේ.

5.1.3 පැමිණිල්ලේ සාක්ෂි අංක 4 විසින් සැක කටයුතු ධීවර යාත්‍රාව අන්තර් ජාතික මුහුදේ ස්ථාන ගතවී ඇති ස්ථානයට අදාල ග්‍රිඩ් අංකය සහ මත්ද්‍රව්‍ය ජාවාරම සිදුවන කාල වේලාවන් තොරතුරුකරුවන්ගෙන් ලබාගෙන නියෝජ්‍ය පොලිස්පතිවරයාට සහ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට දැනුම් දී ඇත.

5.1.4 2019.04.21 වන දින පැය 15.30 ට පැමිණිල්ලේ සාක්ෂි අංක 4, උප පොලිස් පරීක්ෂක උදාර සමග මන්නාරමට ගොස් තොරතුරුකරු හා තොරතුරුකරු මාර්ගයෙන් හඳුනාගත් පාර්ශවකරු මුණ ගැසී ඇත.

5.1.5 2019.04.21 රාත්‍රියේ සැක කටයුතු යාත්‍රාව පැමිණීමට නියමිත බව සහ නෞකාවක් යොමු කළහොත් එය හඳුනාගත හැකි බව එකී පාර්ශවකරු සාක්ෂිකරුට දැනුම් දී ඇත. මේ පිළිබඳව පැ.සා. 4 විසින් නියෝජ්‍ය පොලිස්පතිවරයා දැනුවත් කර ඇත.

5.1.6 කෙසේ වෙතත් ප්‍රගතිය පිළිබඳව තොරතුරක් නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් නොලද හෙයින් සාක්ෂිකරු එනම්, පැ.සා.04 නියෝජ්‍ය පොලිස්පතිවරයාට දුරකථනයෙන් කතා කර නාවිකා යාත්‍රාවක් යොමු කර තිබේ නම් සැක කටයුතු ධීවර යාත්‍රාව අත්අඩංගුවට ගැනීමට හැකි බව දැනුවත් කර ඇත. එසේ දැනුවත් කර ඇත්තේ 2019.04.21 වන දින පැය 19.00 ට වේ.

5.1.7 එදින රාත්‍රී පැය 23.45 ට ඉහත කී ධීවර යාත්‍රාව මත්ද්‍රව්‍ය සහ සැකකරුවන් සමග අත්අඩංගුවට ගෙන ඇති බව තොරතුරුකරුගෙන් පැ.සා.04 දැනගෙන ඇත. ඒ පිළිබඳව නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් විමසීමක් සිදුකර ඇති නමුත් නාවික හමුදාවෙන් ඒ පිළිබඳව දැනුවත් කර නොමැති බව නියෝජ්‍ය පොලිස්පතිවරයා පවසා ඇත.

5.1.8 පසුදින එනම්, 2019.04.22 පැය 07.30 ට නියෝජ්‍ය පොලිස්පති මැදවත්ත දන්වා ඇත්තේ ධීවර යාත්‍රාව අත්අඩංගුවට ගෙන ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරට රැගෙන එන බවට හා සාක්ෂිකරුට ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරට වාර්තා කරන ලෙසට වේ.

5.1.9 සාක්ෂිකරු විසින් තොරතුරුකරු මුණ ගැසී ඔහුගේ ආරක්ෂාව තහවුරු කර එදින දහවල් 11.00 ට පමණ මන්නාරමෙන් පිට වී ඇත.

5.2 <u>ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධගේ සාක්ෂියෙහි විශ්වසනීයත්වය</u>

5.2.1 ධීවර යාත්‍රාව අත්අඩංගුවට ගෙන ඇති බවට වන තොරතුර පැය 23.45 ට ලද බවට ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධ යොදන ලද සටහනේ පැය 23.45 යන ඉලක්කම් ඔහු යොදන ලද සටහනේ සඳහන් පැනට වඩා වෙනස් පැනකින් සටහන් කර ඇති බව අධිකරණය නිරීක්ෂණය කරන ලදී. එසේම අධිකරණයට භාරදී ඇති සටහන්වල (උධෘතවල) එම වේලාව සටහන්ව නොමැති බව නිරීක්ෂණය විය.

5.2.2 පැ.සා.04 පවසන්නේ 2019.04.21 වන දින පැය 23.45 ට යාත්‍රාව සැකකරුවන් සහ හෙරොයින් සමග අත්අඩංගුවට ගත් බව තොරතුරුකරුගෙන් සාක්ෂිකරු දැනගෙන ඒ පිළිබඳව නියෝජ්‍ය පොලිස්පතිවරයා දැනුවත් කළ බවයි.

5.2.3 නමුත් මේ සම්බන්ධයෙන් අධිකරණයට භාර දී ඇති උධෘත කෙරෙහි සාක්ෂිකරුගේ අවධානය යොමු කල අතර එකී සටහන පහත පරිදි වේ. **"…….2019.04.21 පැය 19.00 ට මන්නාරමේදී නි.පො.ප.තුමා දන්වා සිටියා සැක කටයුතු යාත්‍රාව හඳුනාගෙන ඇති බවත්, එය පරීක්ෂා කිරීමට පිළිබඳව විමසීම් කළා. ඒ අනුව තොරතුරුකරු විසින් දන්වා සිටියා එය පරීක්ෂා කිරීම සුදුසු බව ඒ පිළිබඳව නි.පො.ප.තුමා දැනුවත් කළා….. 2019.04.21 පැය xxx ට මන්නාරමේදී නියෝජ්‍ය පොලිස්පතිතුමා දැනුවත් කළා සැක කටයුතු යාත්‍රාව පරීක්ෂා කර ඇති බවට සහ ධීවරයින් 5 ක් සමග හෙරොයින්ද අත්අඩංගුවට ගෙන ඇති බව දන්වන ලදී."**

5.2.4 නමුත් අපරාධ සටහන් පැඩයෙහි පැය 23.45 වශයෙන් සටහන් වන අතර එය එකී සටහනෙහි ලියා ඇති පැනට වඩා වෙනස් පැනකින් සටහන් කර ඇති බව අධිකරණය නිරීක්ෂණය කරන ලදී.

5.2.5 මේ සම්බන්ධයෙන් සාක්ෂිකරු විත්තිය වෙනුවෙන් අසන ලද හරස් ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා යම් පැකිලීමක් දක්වන බවක් සහ යොදා ඇති සටහනට වෙනස් ආකාරයෙන් සාක්ෂි දීමට උත්සාහ කරන බව මෙන්ම අධිකරණය නොමග යැවීමට උත්සාහ දරන බවට අධිකරණය නිරීක්ෂණය කරන ලදී.

(2022.11.23 පස්වරු 01.45 සටහනේ 7 වන පිටුව සහ පස්වරු 02.00 සටහනේ තුන්වන පිටුව බලන්න)

5.2.6 කෙසේ වෙතත් ඉහත සටහන ප්‍රකාරව 2019.04.21 වන දින පැය 19.00 වන විට සැක කටයුතු යාත්‍රාව හඳුනාගෙන ඇති බවට සඳහන්ව තිබුණද සාක්ෂිකරු එම කරුණ පිළිනොගන්නා ලදී.

5.2.7 අනෙක්අතට සාක්ෂිකරුද පිළිගන්නා ආකාරයට මෙම යාත්‍රාව තිබී ඇත්තේ ත්‍රිකුණාමල වරායට කිලෝමීටර් 400 ක් පමණ දුරිනි. පැමිණිල්ලේ සාක්ෂි අංක 01 දහනායක සහ සාක්ෂි අංක 02 බෝවත්ත යන නාවික හමුදා නිලධාරීන්ට අනුව ඔවුන්ට ලබාදුන් තොරතුරු අනුව ඔවුන් හඳුනාගත් සැක කටයුතු ධීවර යාත්‍රාව හැර වෙනත් කිසිදු යාත්‍රාවක් ඒ අවට ප්‍රදේශයේ නිරීක්ෂණය කර නැත. එසේම සාක්ෂි අංක 01 ට අනුව ඔහු ඇතුළු නිලධාරීන් පිරිස ජාත්‍යන්තර මුහුදේදී චූදිතයන් සිටි ධීවර යාත්‍රාවට ගොඩවන විටම එක් පුද්ගලයෙකු තමන් සතුව තිබූ සැටලයිට් දුරකථනයක් මුහුදට දමා ඇත. එසේම මෙම නාවික හමුදා නිලධාරීන්ගේ සාක්ෂිවලට අනුව ධීවර යාත්‍රාවේ සිටියදී අත්අඩංගුවට ගත් මෙම චූදිතයන් භාරයේ තිබී කිසිදු වෙනත් සැටලයිට් දුරකථනයක් සොයාගෙන නැත. එසේම පැය 22.30 වන විට අත්අඩංගුවට ගත් පිරිස සහ නඩු භාණ්ඩ සමග නාවික හමුදා යාත්‍රාවට රැගෙනවිත් ඇත.

5.2.8 පැමිණිල්ලේ සාක්ෂි අංක 04 ට අනුව මෙම මෙහෙයුමට අදාල සියලු තොරතුරු නාවික හමුදාවට ලබාදී ඇත්තේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් විසිනි. ඒ හැර නාවික හමුදාවට මෙම මෙහෙයුමට අදාල වෙනත් කිසිදු තොරතුරක් ලැබී නැත.

5.2.9 පැමිණිල්ලේ සාක්ෂි අංක 01 සහ 02 ට අනුව ධීවර යාත්‍රාවේ සිටි පුද්ගලයන් සන්තකයේ තිබී අත්අඩංගුවට ගත් සියලුම ජංගම දුරකතන පැය 22.30 ට සාක්ෂි අංක 02 බෝවත්ත විසින් භාරගත් අවස්ථාවේ සිට පසුදින පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයට භාරදෙන තෙක් තිබී ඇත්තේ ඔහු භාරයේය.

5.2.10 එසේ නම් පැ.සා.04 පවසන ආකාරයට නාවික හමුදා නිලධාරීන් විසින් ධීවර යාත්‍රාව අත්අඩංගුවට ගත් බවට පැ.සා. 04 ට පැය 23.45 ට ගොඩබිම සිටින තොරතුරුකරුවෙකුගෙන් දැනගැනීමට ලැබුණේය යන කරුණෙහි වියහැකිභාවය පිළිබඳ බරපතල ගැටළුවක් ඇති වේ.

5.2.11 මෙම තොරතුර ලද වේලාව සම්බන්ධයෙන් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් පවත්වාගෙන යනු ලබන අපරාධ පැඩයේ පැය 23.45 යන්න වෙනස් පැනකින් සටහන් කර තිබීමත් අධිකරණයට භාරදුන් උධෘත පිටපත්වල එහි වේලාව සඳහන් නොවීම යන කරුණ ලිහිල්ව සලකා බැලීමට හැකියාවක් නැත.

5.2.12 මෙම කරුණු සළකා බැලීමේදී එම සටහනෙහි පැය 23.45 යන්න පසුව ඇතුලත් කලේය යන අනුමිතියට එළඹීම හැර වෙනත් විකල්පයක් මෙම අධිකරණයට නැත.

5.2.13 අනෙක් අතට තමා යොදන ලද සටහනට පටහැනිව විවෘත අධිකරණයේදී විවිධ අර්ථ නිරූපන දැක්වීමට උත්සාහ දැරීම සහ සටහනේ පැය 23.45 යන්න වෙනස් පැනකින් සටහන් කර තිබීම සම්බන්ධයෙන් වන කරුණු සලකා බැලීමේදී මෙම නිලධාරියා සාක්ෂිකරුවෙකු වශයෙන්

අධිකරණයේ සත්‍ය සාක්ෂියක් දුන්නේද යන්න පිළිබඳව බරපතල සැකයක් ඇති වේ.

5.2.14 එසේම මෙම සාක්ෂිකරු පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් ඡායාරූප ගැනීම සම්බන්ධයෙන්ද පවසන සාක්ෂිය පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය සහ පැ.සා.01 එනම්, නිශාන්ත දහනායකගේ සාක්ෂියට පරස්පර වේ.

5.2.15 ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය එනම්, පැ.සා.3 ට අනුව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ එක් නිලධරයෙකු ඡායාරූප කිහිපයක් ගෙන ඇති අතර තවත් නිලධාරියෙකු වීඩියෝ ගත කිරීමක්ද සිදුකර ඇත. පැමිණිල්ලේ සාක්ෂි අංක 01 නිශාන්ත දහනායකද මෙම තත්ත්වය පිළිගෙන ඇත.

5.2.16 ආරම්භක අවස්ථාවේ සිට අඩුම තරමින් නඩු භාණ්ඩ කිරා මැන බලා අවසන් වනතෙක් මෙම සාක්ෂිකරු එම ස්ථානයේ සිට ඇත. එසේ තිබියදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් එකදු හෝ ඡායාරූපයක් නොගත්තේය යන කරුණ කිසිසේත්ම පිළිගත නොහැක.

5.2.17 මෙම සියලුම කරුණු සලකා බැලීමේදී පැමිණිල්ලේ සාක්ෂි අංක 04 මෙම වැටලීමට අදාලව සිදුවූ කරුණු සම්බන්ධයෙන් ලබා දෙන සාක්ෂිය විශ්වාසනීයත්වයකින් තොර සාක්ෂියක් බවට තීරණය කරමු.

5.3 <u>මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර ඇති ආකාරය සහ පැමිණිල්ලේ ප්‍රධාන සාක්ෂිකරුවන් දෙදෙනාගේ ප්‍රකාශ සටහන් කර ගැනීමට සිදුවූ ප්‍රමාදය</u>

5.3.1 2019.04.23 චූදිතයන් පස්දෙනා පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය එනම්, පැ.සා. 03 විසින් අත්අඩංගුවට ගැනීමෙන් පසු පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයට රැගෙනවිත් 2019.04.24 වන දින වැඩිදුර වාර්තාවක් මගින් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. එසේ ඉදිරිපත් කිරීමේදී එහි කපිතාන් බෝවත්ත, කමාන්ඩර් නිශාන්ත දහනායක සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියගේ සාක්ෂි සම්පිණ්ඩනයක් ඉදිරිපත් කර ඇත.

5.3.2 පැමිණිල්ලේ සාක්ෂි අංක 01 කමාන්ඩර් නිශාන්ත දහනායක සාක්ෂි දෙන අවස්ථාවේදී හෙළිදරව් වූයේ එම සාක්ෂිකරුගේ ප්‍රකාශය 2019.05.13 වන දින සටහන් කර ඇති බවයි. එසේම පැමිණිල්ලේ සාක්ෂි අංක 02 කපිතාන් බෝවත්තගේ ප්‍රකාශ සටහන් කර ඇත්තේ 2019.05.12 දින වේ. 2019.04.21 දින සිදු කලේ යැයි කියන මෙම වැටලීම සම්බන්ධයෙන් සැලකීමේදී එකී වැටලීමට අදාල පැමිණිල්ලේ ප්‍රධානතම සාක්ෂිකරුවන් දෙදෙනා ලෙස සැලකිය හැකි කපිතාන් බෝවත්තගේ සහ කමාන්ඩර් දහනායකගේ ප්‍රකාශ පිළිවෙලින් 2019.05.12 දින (වැටලීමෙන් දින 23 කට පමණ පසුව) සහ 2019.05.13 දින (වැටලීමෙන් දින 24 කට පමණ පසුව) සටහන් කර ගැනීම සැලකිය යුතු ප්‍රමාදයක් බව පැහැදිලිය. තවද එකී ප්‍රමාදයට පිළිගත හැකි පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීමටද පැමිණිල්ල අපොහොසත් වී ඇති බව පෙනේ. විශේෂයෙන්ම මෙම සාක්ෂිකරුවන් නිල සාක්ෂිකරුවන් වීම හේතුකොටගෙන ඉහත කී ප්‍රමාදය පැමිණිල්ලට වඩාත් අහිතකර ලෙස බලපාන බව අපට පෙනේ.

5.3.3 ඉහත කී සාක්ෂිකරුවන් දෙදෙනාගේ ප්‍රකාශය එම දිනයන් හිදී සටහන් කර ගත්තේ නම් 2019.04.24 දිනැති වැඩිදුර වාර්තාවේ එම නිලධාරීන් දෙදෙනාගේ සාක්ෂි සම්පිණ්ඩනයක් ඉදිරිපත් වූයේ කෙසේද යන්න පිළිබඳව ඇති වූ ව්‍යාකූලත්වය නිරාකරණය කර ගැනීම සඳහා පැමිණිල්ලේ සාක්ෂි අංක 03 ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය 2022.11.15 වන දින අධිකරණය විසින් නැවත කැඳවන ලදී.

5.3.4 එහිදී ඔහුගේ ස්ථාවරය වූයේ පැ.සා. 01 සහ පැ.සා. 02 ගේ ප්‍රකාශයන් ලිඛිතව සටහන් කර නොගත් නමුදු වාචිකව ඔවුන්ගෙන් වැටලීම සිදු වූ ආකාරය දැනගත් බවයි.

5.3.5 2019.04.24 දිනැති පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ ස්ථානාධිපතිවරයා වශයෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියගේ එනම්, පැ.සා. 03 ගේ අත්සනින් ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තාවේ සාක්ෂි සම්පිණ්ඩනය කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කරමු.

5.3.6 **"කපිතාන් ටී.ඒ.එස්. අනිල් බෝවත්ත සහ කමාන්ඩර් නිශාන්ත දහනායක - නාවික හමුදාව"** යන ශීර්ෂය යටතේ එහි අවසාන ජේළිය මෙසේය. **....... එකී නඩු භාණ්ඩ හා සැකකරුවන් පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ ස්ථානාධිපති වෙත භාර දීමට කටයුතු කල බව පවසා ප්‍රකාශයක් ලබා දී ඇත.**

5.3.7 **"කමාන්ඩර් නිශාන්ත දහනායක නාවික හමුදාව"** යන ශීර්ෂය යටතේ මෙසේ සඳහන් කර ඇත. **ඉහත කපිතාන් අනිල් බෝවත්ත මහතාගේ ප්‍රකාශය සනාත කරමින් ප්‍රකාශයක් ලබා දී ඇත.**

5.3.8 2019.04.24 වන දින උගත් මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තාවේ ඉහත සඳහන් ආකාරයට වාර්තා කිරීමෙන් පෙනී යන්නේ එම සාක්ෂිකරුවන් දෙදෙනාගේ ප්‍රකාශ සටහන් කර ගෙන ඇති බව සහ ඒවායෙහි සම්පිණ්ඩනය එසේ ඉදිරිපත් කරන බවකි.

5.3.9 කෙසේ වෙතත් පැ.සා. 03 එනම්, ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය පිළිගත් ආකාරයට එම සාක්ෂිකරුවන් දෙදෙනාගේ ප්‍රකාශ පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් විසින් සටහන් කරගෙන ඇත්තේ 2019.05.12 සහ 2019.05.13 යන දිනයන් හිදීය.

5.3.10 අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 110(1) උප වගන්තියෙහි විමර්ශනයක් අතරතුර සාක්ෂිකරුවන්ගෙන් ලබා ගන්නා ප්‍රකාශ ලිඛිතව සටහන් කළයුතු බවට සඳහන් කර ඇත.

5.3.11 අපරාධ විමර්ශනයක මුල් තොරතුර හෝ විමර්ශනය අතරතුර සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ වාචිකව ලබා ගැනීමට ප්‍රතිපාදන නොමැති අතර එවැනි ප්‍රකාශයක් අනිවාර්යෙන්ම ලිඛිතව තිබිය යුතු බව නෛතික අවශ්‍යතාවයකි.

5.3.12 ඒ අනුව පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශය වැනි විශේෂ පුහුණුවක් ලත් නිලධාරීන්ගෙන් සමන්විත ආයතනයක ස්ථානාධිපතිවරයෙකු වශයෙන්

කටයුතු කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය එනම්, සාක්ෂි අංක 03 2019.04.24 වන දින චූදිතයන් සහ නඩු භාණ්ඩ ඉදිරිපත් කරමින් ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තාව අසත්‍ය කරුණු වලින් යුත් වාර්තාවක් බව පැහැදිලිව පෙනී යයි.

5.3.13 අප රට තුළ පවතින අපරාධ යුක්ති ක්‍රියාදාමය තුළ අත්අඩංගුවේ ඉදිරිපත් කරනු ලබන සැකකරුවෙකු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු අධිකරණ නියෝග නිකුත් කිරීමේදී පදනම් කරගනු ලබන්නේ විමර්ශන නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු වාර්තා වේ.

5.3.14 එවැනි තොරතුරු වාර්තාවල අසත්‍ය කරුණු වාර්තා කරන්නේ නම් එය බරපතල යුක්ති අපගමනයක් සිදු වීමට හේතුවක් වේ.

5.4 <u>පැමිණිල්ලේ සාක්ෂි අංක 14 හිටපු පොලිස් සැරයන් සමීර ධනුෂ්කගේ සාක්ෂිය විශ්ලේෂණය</u>

5.4.1 මෙම සාක්ෂිකරු 2019 අප්‍රේල් මාසය වනවිට පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ භාණ්ඩ භාරකරු ලෙස රාජකාරි කර ඇත.

5.4.2 2019.04.24 වන දින පැමිණිල්ලේ සාක්ෂි අංක 03 ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය විසින් දේපළ කුවිතාන්සි අංක 225/2019, දේපළ කුවිතාන්සි අංක 226/2019 යටතේ හෙරොයින් පාර්සල් 248 ක් සහ පොලිසැක් උර 26 ක්, කහ සහ නිල් පැහැති නූල් අඩංගු පොලිසැක් උරයක් භාරදී ඇත.

5.4.3 මෙම නඩු භාණ්ඩ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 10134/01/19 ට අදාලව භාරගෙන ඇති අතර ඒවා රජයේ රස පරීක්ෂක කාර්යාලයට සාක්ෂිකරු විසින් භාරදී ඇත. එසේ භාරදී ඇත්තේ 2019.04.25 දින වේ.

5.4.4 එකී භාණ්ඩ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට භාරදීමෙන් පසු CD 5035/2019 දරණ සංදේශය රජයේ රස පරීක්ෂක කෙඩිතුවක්කු මහත්මියගෙන් සාක්ෂිකරු භාරගෙන ඇත.

5.4.5 එසේම මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්න වලට භාජනය කිරීමේදී පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ නඩු භාණ්ඩ අස්ථානගත වීමක් සම්බන්ධයෙන් හා මහා පරිමාණ ජාවාරම්කරුවන් සමග එකතු වී මත් ද්‍රව්‍ය ජාවාරම් කිරීම මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සාක්ෂිකරු අත්අඩංගුවට ගත් බව පිළිගන්නා ලදී.

5.4.6 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම සාක්ෂිකරු අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී සාක්ෂිකරුගේ නිවසේ තිබී පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ නඩු භාණ්ඩ කාමරයේ ආරක්ෂිත සේප්පුවේ යතුරක් සමග යතුරු දෙකක් සොයා ගත් බවට සඳහන් කර තිබුනද එය සත්‍යයක් නොවන බව සාක්ෂිකරු පවසයි.

5.4.7 ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරු පැහැදිලි කර සිටියේ පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ සිටියදී ඔහු අත්අඩංගුවට ගන්නා විට සාක්කුවේ තිබූ සේප්පුවේ යතුරු දෙකක් සමග යතුරු කැරැල්ල අත්අඩංගුවට ගෙන තිබුනද අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් එක් යතුරක් නිවසේ තිබූ බවට සටහන් කර ඇති බවයි.

5.4.8 පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සාක්ෂිකරුගේ නිවස පරීක්ෂා කර තිබූ භාණ්ඩ ලේඛනයක් තිබෙන බවද, එහි කිසිදු අවස්ථාවක යතුරක් සම්බන්ධයෙන් සටහන් නොවන බවද පවසයි.

5.4.9 සාක්ෂිකරු වැඩිදුරටත් පවසා සිටියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සාක්ෂිකරු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති වාර්තා අසත්‍ය බවයි.

5.4.10 සාක්ෂිකරු වැඩිදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පවසා සිටියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කල වාර්තාවේ හෙරොයින් මිලිග්‍රෑම් 19 ක ප්‍රමාණයක් තම නිවසේ තිබී අත්අංඩංගුවට ගත් බවට සටහන් කර තිබුනද එයද සත්‍යයක් නොවන බවයි.

5.4.11 එසේම පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ ආරක්ෂිත සේප්පුවේ තිබී ගිනි පෙට්ටියක් තුළ තිබූ හෙරොයින් ප්‍රමාණයක් සොයාගෙන තිබුනේ යැයි පැවසුවද ඒවා සොයා ගන්නා විට තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටි හෙයින් මේ සම්බන්ධයෙන් කිසිවක් නොදන්නා බව පවසන ලදී.

5.4.12 හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු වැඩිදුරටත් පවසා සිටියේ පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් දෙදෙනෙකු අතර තිබූ පුද්ගලික කෝන්තරයකට මත් ද්‍රව්‍ය කාර්යංශයේ සිටින නිලධාරීන් කොටසකට මේ ආකාරයට නඩු පවරා ඇති බවයි.

5.4.13 තමා රැඳවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටියදී පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ එක් නිලධරයෙකු හිරිහැර කල බවද, යම්කිසි අවස්ථාවක අධිකරණ පරිශ්‍රයේ සිටියදී එම නිලධාරියා තමාට බැන වදුනු බවත්, මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවා වාර්තා කල බව පවසන ලදී.

5.4.14 විත්තියෙන් අසන ලද හරස් ප්‍රශ්නවලට සහ අධිකරණයෙන් අසන ලද ප්‍රශ්න හමුවේ මෙම සාක්ෂිකරු ලබා දුන් පිළිතුරු කිසිදු ආකාරයකට හබයට ලක් වී නැත.

5.4.15 පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ රාජකාරී කල නිලධරයෙකු විශේෂයෙන්ම පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ නඩු භාණ්ඩ භාරකරුවෙකු වශයෙන් කටයුතු කල නිලධරයෙකු විසින් පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනයන් සම්බන්ධයෙන් එල්ල කරන ලද චෝදනා ඉතා බරපතල වේ.

5.4.16 පැමිණිල්ලේ සාක්ෂි අංක 14 ලෙස නම් කර තිබූ මෙම සාක්ෂිකරු මත් ද්‍රව්‍ය චෝදනාවකට අදාලව සැකකරුවෙකු වශයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගෙන තිබූ බව ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 35602/1/20 දරණ නඩුවට ඉදිරිපත් කර ඇති බව පැමිණිල්ල අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගන්නා ලදී.

5.4.17 එසේම 2020.07.21 දිනැතිව ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තාව අනුව මෙම සාක්ෂිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහුගේ නිවස පරීක්ෂා කිරීමේදී සාක්ෂිකරුගේ නිවසේ තිබී පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ නඩු භාණ්ඩ කාමරයේ ආරක්ෂිත සේප්පුවේ එක් යතුරක් සමග යතුරු දෙකක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් භාරයට ගෙන ඇති බවට වාර්තා කර ඇති බව පැමිණිල්ල පිළිගන්නා ලදී.

5.4.18 පැමිණිල්ලේ සාක්ෂි අංක 14 ට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහේස්ත්‍රාත් අධිකරණයට දක්වා ඇති සැළකිරීම් මෙන්ම මෙම ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ දිවුරුම්පිට සාක්ෂි දෙමින් මෙම සාක්ෂිකරු පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් කෙරෙහි එල්ල කරන චෝදනා සළකා බලන විට මෙන්ම මෙම නඩුවට අදාලව පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ ස්ථානාධිපතිවරයා විසින් මහේස්ත්‍රාත් අධිකරණයට අසත්‍ය කරුණු වලින් යුත් තොරතුරු වාර්තාවක් ගොනු කිරීම යන කරුණු සැළකිල්ලට ගැනීමේදී අප රට තුළ මත් ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධානතම ආයතනයේ තත්ත්වය සම්බන්ධයෙන් මෙම ත්‍රිපුද්ගල අධිකරණය මවිතයට පත් වූ බව සටහන් කර තබමු.

## 5.5 <u>2019.04.23 වන දින සාගර නමැති නාවික හමුදා යාත්‍රාව තුළ ලබා ගන්නා ලද ඡායාරූප සාක්ෂි වශයෙන් ඉදිරිපත් නොකිරීම</u>

5.5.1 පැමිණිල්ලේ සාක්ෂි අංක 03 ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියට අනුව නාවික හමුදාව විසින් තම භාරයට ගෙන සිටි මෙම නඩුවේ චූදිතයන් සහ නඩු

භාණ්ඩ භාර ගැනීම සඳහා පිටව යන අවස්ථාවේදී කැමරාවක් සහ වීඩියෝ කැමරාවක් රැගෙන ගිය බව සටහන් කර ඇත.

5.5.2 පැමිණිල්ලේ සාක්ෂි අංක 03 සාක්ෂි දෙමින් පවසා සිටියේ නාවික හමුදා යාත්‍රාවට ගොඩ වූ පසු චූදිතයින් සහ නඩු භාණ්ඩ තිබූ ස්ථානයෙහි ඡායාරූප ගැනීම හා වීඩියෝ කිරීම ආරම්භ කරන ලද අවස්ථාවේදී පැමිණිල්ලේ සාක්ෂි අංක 01 කමාන්ඩර් දහනායක නාවික හමුදාපතිවරයාගේ අවසරයකින් තොරව ඡායාරූප ගැනීම හා වීඩියෝ කිරීම සඳහා අවසර ලබාදිය නොහැකි බවට දැන් වූ හෙයින් ඡයාරූප ගැනීම හා වීඩියෝ කිරීම නවතා දැමීමට සිදු වූ බව පවසන ලදී.

5.5.3 කෙසේ වෙතත් ඔහු පවසා සිටියේ ඡායාරූප කීපයක් සහ ඉතා කෙටි වීඩියෝ පටයක් තිබුනු බවද, ඒවායෙහි සාක්ෂිකරු නාවික හමුදා යාත්‍රාවට ගොඩවන අවස්ථාවේදී චූදිතයන් සහ නඩු භාණ්ඩ තිබූ ආකාරය සටහන්ව තිබූ බවද පවසන ලදී.

5.5.4 විත්තියේ හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී සාක්ෂිකරුගේ අවධානය සඳහා පොලිස් සැරයන් 14381 සුහසිංහ විසින් අපරාධ සටහන් පැඩයේ සටහනක් කෙරෙහි අවධානය යොමු කරන ලදී. එහි ඔහු සඳහන් කර ඇත්තේ **"....... සියළුම අවස්ථාවන් ඡායාරූප ගතකර ඇති බවයි"** යනුවෙනි. (2022.11.01 විභාග සටහන්වල ආරම්භක සටහනේ 13 වන පිටුව)

5.5.5 පැමිණිල්ලේ සාක්ෂි අංක 01 ද සාක්ෂි දෙමින් ඡායාරූප කීපයක් හා ඉතා කෙටි වීඩියෝ පටයක් තිබුනු බවද පිළිගෙන ඇත.

5.5.6 පැ.සා. 03 වැඩිදුරටත් පවසා සිටියේ මෙම ඡායාරූප සහ වීඩියෝ පටය මත් ද්‍රව්‍ය කාර්යංශයේ ඇති බවයි. නමුත් ඒවා සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට පැමිණිල්ල කටයුතු නොකරන ලදී.

5.5.7 මේ සම්බන්ධයෙන් විත්තිය මෙන්ම අධිකරණයද ප්‍රශ්න කර සිටියද පොලිස් සැරයන් 14381 සුහසිංහ හෝ පොලිස් කොස්තාපල් 40811 පෙරේරා සාක්ෂිකරුවන් වශයෙන් කැඳවීමට පැමිණිල්ල අපොහොසත් වී ඇත.

5.5.8 මීට අදාලව සාක්ෂි ආඥා පනතේ 114(ඊ) නිදර්ශනය වැදගත් වේ. ඒ අනුව ඉදිරිපත් කළහැකි, එහෙත් එසේ කරනු නොලබන සාක්ෂි ඉදිරිපත් කරනු ලැබුවහොත්, එය වලක්වා සිටින තැනැත්තාට අවැඩදායක විය හැකි බවට පූර්ව නිගමනය කළහැකි බවට සඳහන් කර ඇත.

5.5.9 පැ.සා 03 පිළිගත් පරිදි අඩුමතරමින් ඡායාරූප කීපයක් හා යම් ප්‍රමාණයක වීඩියෝ පටයක් ඔහු විසින් පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයට භාර දී ඇත. එපමණක් නොව පොලිස් සැරයන් 14381 සටහන් කර ඇත්තේ මෙම සියළුම අවස්ථාවන් ඡායාරූප ගතකර ඇති බවයි.

5.5.10 එබැවින් ඉහත කී සාක්ෂි අධිකරණයට ඉදිරිපත් නොකිරීම තුළ සාක්ෂි ආඥා පනතේ 114(ඊ) නිදර්ශනය අනුව මෙම ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලට එළඹිය හැකි එකම අනුමිතිය වන්නේ ඒවා ඉදිරිපත් කලහොත් එම සාක්ෂි පැමිණිල්ලට අවැඩදායක වන හෙයින් පැමිණිල්ල විසින් එකී සාක්ෂි ඉදිරිපත් නොකළ බවයි.

## 5.6 <u>නඩු භාණ්ඩවල අනන්‍යතාවය සහ නඩු භාණ්ඩ දාමය</u>

5.6.1 මෙම නඩුවේ නඩු භාණ්ඩවල අනන්‍යතාවය සහ නඩු භාණ්ඩ දාමය පැමිණිල්ල විසින් නිසි පරිදි ඔප්පු කර තිබේද යන කරුණ අපි විසින් දැන් සලකා බලමු.

5.6.2 පැමිණිල්ලේ ස්ථාවරය වන්නේ චූදිතයන් සන්තකයේ තිබූ හෙරොයින් අඩංගු වූයේ පොලිසැක් උර 13 ක බවයි. මෙම පොලිසැක් උර චූදිතයන් සිටි ධීවර යාත්‍රාවෙන් සාගර නෞකාව තුලට දමා ගැනීමෙන් පසුව ඒවායේ භාරය පැවතියේ **කපිතාන් අනිල් බෝවත්ත** යටතේය. 2019.04.21 දින රාත්‍රියේ සිට 2019.04.23 දින පෙරවරුව දක්වාම එම පොලිසැක් උර අනිල් බෝවත්ත භාරයේ පැවති බව අනාවරණය වේ. පොලිසැක් උර ඔහු විසින් 2019.04.23 වන දින පෙරවරුවේ ත්‍රිකුණාමලය වරායේදී නියෝජ්‍ය පොලිස්පති සජීව මැදවත්ත වෙත භාර දී ඇත.

5.6.3 කපිතාන් බෝවත්තගේ ස්ථාවරය වන්නේ තමා භාරයේ පැවති පොලිසැක් උර 13 සුදු පාට සහ කහ පාට උර බවයි. කෙසේ නමුත් ඉහත කී පොලිසැක් උර 13 අතුරින් කිසිදු උරයක් මෙම සාක්ෂිකරු විසින් සිය සාක්ෂියේදී හඳුනාගෙන නැති අතර එකී පොලිසැක් උර කිසිවක් මෙම සාක්ෂිකරු මගින් සලකුණු කර නැත. 2019.04.21 දින රාත්‍රියේ සිට 2019.04.23 දින පෙරවරුව දක්වා දීර්ඝ වේලාවක් මෙම සාක්ෂිකරු භාරයේ පැවති පොලිසැක් උර 13 ඔහු සාක්ෂි දෙන අවස්ථාවේ ඔහු වෙත ඉදිරිපත් කර ඒවා හඳුනාගැනීමට හැකියාව තිබේද යන්න පවා විමසීමට පැමිණිල්ල අපොහොසත් වී ඇත. ඇත්තෙන්ම එකී පොලිසැක් උර 13 හඳුනාගැනීම සඳහා මෙම සාක්ෂිකරු වෙත ඉදිරිපත් නොකලේ කුමන

හේතුවක් නිසා දැයි වටහා ගැනීම අසීරුය. එකී අපොහොසත්වීම නඩු භාණ්ඩවල අනන්‍යතාවය සහ නඩු භාණ්ඩ දාමය ඔප්පු කිරීමේදී පැමිණිල්ලට අහිතකර ලෙස බලපෑම වැලැක්විය නොහැකි බව අපට පෙනේ. අනෙක් අතට ඉහත කී පොලිසැක් උර 13 හි අනන්‍යතාවය පිළිබඳව නිසි අවබෝධයකින් පැමිණිල්ල මෙහෙයවූයේ නම් ඒවා හඳුනාගැනීම සඳහා අනිවාර්යයෙන්ම මෙම සාක්ෂිකරු වෙත ඉදිරිපත් කල යුතුව තිබූ බව අපගේ අදහසයි.

5.6.4 කපිතාන් බෝවත්තගෙන් ඉහත කී පොලිසැක් උර 13 ත්‍රිකුණාමලය වරායේදී භාරගෙන ඇත්තේ **නියෝජ්‍ය පොලිස්පති සජීව මැදවත්ත** විසිනි. ඒ 2019.04.23 දින පෙරවරුවේදීය. එම උර අතුරින් එක් උරයක් කහ පාටට හුරු බවත්, අනෙක් උර සියල්ලම සුදු පාට බවත් මෙම සාක්ෂිකරුගේ ස්ථාවරයයි.

5.6.5 කපිතාන් බෝවත්තගෙන් මුල් වරට තම භාරයට ගත් පොලිසැක් උර 13 හඳුනාගත හැකිදැයි නියෝජ්‍ය පොලිස්පති මැදවත්තගෙන් විමසන ලදුව පැමිණිල්ල විසින් ඔහුට පොලිසැක් උර 13 ක් පෙන්වා සිටින ලදී. එම පොලිසැක් උර 13 අතුරින් උර 11 ක් හඳුනාගැනීම අපහසු බව සාක්ෂිකරු පවසා ඇත. එම උර 13 අතුරින් උර 2 ක් නිශ්චිතවම තමා මුල් වරට තම භාරයට ගත් උර නොවන බව සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත. සාක්ෂිකරුගේ මෙම ස්ථාවරය නඩු භාණ්ඩවල අනන්‍යතාවය සහ නඩු භාණ්ඩ දාමය සම්බන්ධයෙන් පැමිණිල්ලට බෙහෙවින් අහිතකර ලෙස බලපෑ බව අමුතුවෙන් කිව යුතු නැත.

5.6.6 නියෝජ්‍ය පොලිස්පති මැදවත්ත වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත්තේ චූදිතයන් සන්තකයේ තිබුණේ යැයි කියන පොලිසැක් උර 13 තුල හෙරොයින්

අඩංගු පැකට් (පාර්සල්) 248 ක් තිබූ බවත්, එම පැකට් 248 ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය විසින් පසුව සුදු පැහැති පොලිසැක් උර 13 ක් තුලට (පසුව සපයා ගත් පොලිසැක් උර 13 ක් තුලට) දමා මුද්‍රා තැබූ බවත්ය. ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය විසින් පසුව හෙරොයින් පැකට් 248 දමන ලද පොලිසැක් උර 13 මෙම සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදුව ඒවා පැ.16 සිට පැ.28 දක්වා සලකුණු කරන ලදී. මෙහිදී නිතැතින්ම උද්ගත වන ගැටළුවක් ඇත. එනම් ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය විසින් පසුව හෙරොයින් පැකට් 248 දමන ලද පොලිසැක් උර 13 හඳුනාගත් මෙම සාක්ෂිකරුට කපිතාන් බෝවත්ත විසින් මුල් අවස්ථාවේ තමා වෙත භාරදෙන ලද පොලිසැක් උර 13 හඳුනාගැනීමට නොහැකි වූයේ කුමන හේතුවක් නිසාද යන්නයි. ඇත්තෙන්ම ඒ සම්බන්ධයෙන් පිළිගත හැකි පැහැදිලි කිරීමක් කිරීමට මෙම සාක්ෂිකරු අපොහොසත් වී ඇති බව ඔහුගේ සාක්ෂිය සමස්තයක් ලෙස සැලකීමේදී පැහැදිලිව පෙනේ.

5.6.7 තවද නියෝජ්‍ය පොලිස්පති මැදවත්තට මුල් වරට තමා භාරයට ගත් පොලිසැක් උරවල තිබූ අකුරු පවා හොඳින් මතකය. ඔහුගේ සාක්ෂිය අනුව එම උරවල සිංහල සහ ඉංග්‍රීසි අකුරු තිබූ අතර අනිවාර්යෙන්ම උර 2 ක හෝ 3 ක සිංහල අකුරු තිබිණ. "ක්‍රිස්බ්‍රෝ කුකුල් මස් " යනුවෙන් සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් සඳහන්ව තිබූ බව සාක්ෂිකරුට නිශ්චිතවම මතකය. මෙවන් පසුබිමක් තුල තමා මුල් වරට භාරයට ගත් පොලිසැක් උර 13 හඳුනාගැනීමට මෙම සාක්ෂිකරු අපොහොසත් වීම ඇත්තෙන්ම පුදුම සහගතය.

5.6.8 කපිතාන් බෝවත්තගෙන් නියෝජ්‍ය පොලිස්පති මැදවත්ත විසින් ඉහත කී පොලිසැක් උර 13 සාගර නෞකාව මතදී භාරගත් අවස්ථාවේදී **ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියද** එම ස්ථානයේ සිට ඇත. මුල් වරට සාගර නෞකාව මත තිබූ පොලිසැක් උර 13 මත P 1 සිට P 13 දක්වා තමා විසින් නිල් පෑනකින් සලකුණු කල බව මෙම සාක්ෂිකරුගේ ස්ථාවරයයි. මුල් වරට සාගර නෞකාව මත තිබූ පොලිසැක් උර 13 සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදුව ඒවා පැ.65 සිට පැ.76 දක්වා සහ පැ.78 ලෙස සලකුණු කරන ලදී.

5.6.9 ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත්තේ තමා විසින් P 1 සිට P 13 දක්වා නිල් පෑනෙන් සලකුණු කල උර 13 මත නැවත P 1 සිට P 13 ලෙස සලකුණු යොදන ලෙසත්, එම උර ඇතුලත තිබූ උර 13 මත P 1 A සිට P 13 A දක්වා සලකුණු යොදන ලෙසත් තමා පොලිස් සැරයන් පද්මසිරිට උපදෙස් දුන් බවයි. කෙසේ නමුත් පොලිස් සැරයන් පද්මසිරි එම උපදෙස් අනුව ක්‍රියාකර නැති බව ඔහු විසින් යොදන ලද පහත සඳහන් සලකුණු මගින් අනාවරණය විය.

1. හිරියාදෙණිය විසින් P 1 ලෙස සලකුණු කල උරය (පැ.65) මත පද්මසිරි විසින් යොදා ඇත්තේ P 1 A සලකුණයි.
2. හිරියාදෙණිය විසින් P 2 ලෙස සලකුණු කල උරය (පැ.66) මත පද්මසිරි විසින් යොදා ඇත්තේ P 2 A සලකුණයි.
3. හිරියාදෙණිය විසින් P 4 ලෙස සලකුණු කල උරය (පැ.68) මත පද්මසිරි විසින් යොදා ඇත්තේ P 4 A සලකුණයි.

4. හිරියාදෙණිය විසින් P 7 ලෙස සලකුණු කල උරය (පැ.71) මත පද්මසිරි විසින් යොදා ඇත්තේ P 7 A සලකුණයි.
5. හිරියාදෙණිය විසින් P 8 ලෙස සලකුණු කල උරය (පැ.72) මත පද්මසිරි විසින් යොදා ඇත්තේ P 8 A සලකුණයි.
6. හිරියාදෙණිය විසින් P 9 ලෙස සලකුණු කල උරය (පැ.73) මත පද්මසිරි විසින් යොදා ඇත්තේ P 9 A සලකුණයි.
7. හිරියාදෙණිය විසින් P 12 ලෙස සලකුණු කල උරය (පැ.75) මත පද්මසිරි විසින් යොදා ඇත්තේ P 12 A සලකුණයි.

5.6.10 පොලිස් සැරයන් පද්මසිරි විසින් තම උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක කර නොමැති බවත්, තමාගේ අධීක්ෂණයේ දුර්වලතාවයක් සිදුවී ඇති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස නඩු භාණ්ඩ සලකුණු කිරීම සම්බන්ධයෙන් ව්‍යාකූල තත්වයක් උද්ගත වී ඇති බවත් ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය සිය සාක්ෂියේදී පිළිගෙන ඇත.

5.6.11 මේ සම්බන්ධයෙන් පොලිස් සැරයන් පද්මසිරි සාක්ෂි දෙමින් පවසා ඇත්තේ ඉහත කී අවස්ථා 7 හිදීම තමාට වැරදීම් සිදුවී ඇති බවයි. පොලිස් සැරයන් පද්මසිරි සාක්ෂි දෙමින් ප්‍රකාශ කලේ ඔහු විසින් පොලිසැක් උර මත සලකුණු යෙදීමේදී එම ස්ථානයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියද සිටි බවයි. එසේනම් පොලිස් සැරයන් පද්මසිරි විසින් ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියගේ උපදෙස් වලට පටහැනි ආකාරයෙන් පොලිසැක් උර 7 ක් මත දෝෂ සහගත සටහන් යොදා ඇත්තේ ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියද එම ස්ථානයේ සිටියදීමය. එසේනම් ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය

තමා ඉදිරියේදීම තම කනිෂ්ඨ නිලධාරියෙක් තම උපදෙස් වලට පටහැනි ලෙස ක්‍රියාකරන ආකාරය දෙස නිහඬව බලා සිටියේද?

5.6.12 ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියද පවසන ලද්දේ "ක්‍රිස්බ්‍රෝ චිකන් " යනුවෙන් සිංහලෙන් සඳහන්ව තිබූ පොලිසැක් උරයක් මුල් අවස්ථාවේ තමා සාගර නෞකාව මතදී නිරීක්ෂණය කල බවයි. එහෙත් ඒ අයුරින් සඳහන්ව තිබූ කිසිදු උරයක් සිය සාක්ෂියේදී හඳුනාගැනීමට ඔහු අපොහොසත් විය. "ක්‍රිස්බ්‍රෝ චිකන් " යනුවෙන් සිංහලෙන් සඳහන්ව තිබූ පොලිසැක් උරයක් මුල් අවස්ථාවේ සාගර නෞකාව තුලදී මෙම සාක්ෂිකරු සහ අප මීට පෙර සඳහන් කල ආකාරයට නියෝජ්‍ය පොලිස්පති මැදවත්ත නිරීක්ෂණය කලේ නම් එවන් උරයක් නඩු භාණ්ඩ සලකුණු කිරීමේදී හඳුනාගැනීමට එම සාක්ෂිකරුවන් අපොහොසත් වූයේ ඇයි? .

5.6.13 ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය විසින් ගත් ස්ථාවරය වූයේ මුල් අවස්ථාවේ නෞකාව මතදී තමා දුටු පොලිසැක් උර 13 මතම තමා විසින් නිල් පැනකින් P 1 සිට P 13 දක්වා සලකුණු යෙදූ බවයි. එහෙත් ඔහු P 10 ලෙස සලකුණු කරන ලද උරයක් මෙම අධිකරණය ඉදිරියේ නඩු භාණ්ඩ සලකුණු කිරීමේදී දක්නට නොලැබිණ. P 10 සහ P 10 A ලෙස පොලිස් සැරයන් පද්මසිරි විසින් කළු පැනකින් යොදන ලද සලකුණු සහිත උර දෙකක් තිබිණ. ඒ අතුරින් P 10 ලෙස වූ කළු පැහැති සලකුණ සහිත උරය ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය විසින් P 10 ලෙස නිල් පැනෙන් සලකුණු කල උරය ලෙස උපකල්පනය කරමින් එය පැ.78 ලෙස සලකුණු කරන ලදී. ඉහත කරුණු අනුව පෙනී යන්නේ ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය විසින්

කිසියම් උරයක් මත ඇත්ත වශයෙන්ම P 10 ලෙස සලකුණු කිරීමක් සිදු කලේද යන්න පවා සැක සහිත බවයි. ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය විසින් ලබාදුන්නේ යැයි කියන උපදෙස් වලට පටහැනිව පොලිස් සැරයන් පද්මසිරි ක්‍රියාකල බව පැහැදිලිව අනාවරණය වී තිබීමෙන් මෙම සැකය වඩාත් වැඩිවේ.

5.6.14 අනෙක් අතට මුල් අවස්ථාවේ නෞකාව මත පොලිසැක් උර 13 තිබූ ආකාරය දැක්වෙන ඡායාරූප කිහිපයක් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ ඇති බවත්, තමා එම ඡායාරූප දුටු බවත් ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය සිය සාක්ෂියේදී පැහැදිලිව ප්‍රකාශ කර ඇත. එහෙත් එවන් කිසිදු ඡායාරූපයක් ඉදිරිපත් කිරීමට පැමිණිල්ල අපොහොසත් විය.

5.6.15 නියෝජ්‍ය පොලිස්පති මැදවත්තගේ ස්ථාවරය වූයේ හෙරොයින් අඩංගුව තිබූ පාර්සල් 248 අතුරින් එක් පාර්සලයක් පමණක් ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයකට ලක් කල බවයි. එහෙත් ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියගේ ස්ථාවරය වූයේ තමා විසින් එක් එක් පොලිසැක් උරයෙන් ලබාගත් පාර්සලය බැගින් පාර්සල් 13 ක් ක්ෂේත්‍ර පරීක්ෂණයට ලක් කල බවයි. තවද තමා එම ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකල අවස්ථාවේ නියෝජ්‍ය පොලිස්පති මැදවත්තද එම ස්ථානයේ සිටි බව ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියගේ ස්ථාවරයයි. එකම ස්ථානයේ සිටි සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ සාක්ෂි අතර මෙවන් පරස්පරවිරෝධී තත්වයක් ඇති වීමට හේතුව කුමක්ද? .

5.6.16 චූදිතයන් සන්තකයේ තිබුණේ යැයි කියන පොලිසැක් උර 13 පැමිණිල්ලේ සාක්ෂිකරුවන් අතුරින් මුලින්ම දැක ඇත්තේ **කමාන්ඩර් නිශාන්ත දහනායක** විසිනි. ඔහුගේ ස්ථාවරය වන්නේ එම උර අතුරින් එක් උරයක් පමණක් විවෘතව තිබූ බවයි. කපිතාන් බෝවත්තගේ ස්ථාවරය වන්නේද විවෘතව තිබුණේ එක් උරයක් පමණක් බවයි. ඔහුගේ පැහැදිලි ස්ථාවරය වූයේ අනෙක් උර 12 පොලිස් නිලධාරීන්ට භාරදෙන තෙක් කිසිසේත්ම විවෘත නොකල බවයි. එහෙත් නියෝජ්‍ය පොලිස්පති මැදවත්තගේ සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියගේ ස්ථාවරය වූයේ එම උර අතුරින් උර දෙකක් විවෘතව තිබූ බවයි. මෙම පරස්පරවිරෝධී ස්ථාවරයන් ඇති වීමට හේතුව කුමක්ද? .

5.6.17 අප ඉහත සඳහන් කල කරුණු සමස්තයක් ලෙස සැලකීමේදී පෙනී යන්නේ මෙම නඩුවේ නඩු භාණ්ඩවල අනන්‍යතාවය සහ නඩු භාණ්ඩ දාමය නිසි පරිදි ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බවයි. එම තත්ත්වය පැමිණිල්ලේ සමස්ත නඩුව කෙරෙහිම බෙහෙවින් අහිතකර ලෙස බලපා ඇති බව අපට පෙනේ.

5.7 <u>ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියගේ ක්‍රියා කලාපය සහ ඔහුගේ සාක්ෂියේ විශ්වසනීයත්වය</u>

5.7.1 අප ඉහත සඳහන් කල ආකාරයට ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණිය විසින් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත අසත්‍ය කරුණු වලින් සමන්විත වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව පැහැදිලිය. එවකට පොලිස් මත් ද්‍රව්‍ය කාර්යංශයේ ස්ථානාධිපතිවරයා ලෙස ක්‍රියා කල මෙම සාක්ෂිකරු

එවන් අසත්‍ය කරුණු වලින් සමන්විත වැඩිදුර වාර්තාවක් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම බෙහෙවින් අසතුටුදායක සහ ඉතා බරපතල තත්ත්වයක් බව අමුතුවෙන් කිව යුතු නැත. ඇත්තෙන්ම එකී වාර්තාව මගින් ඔහු විමර්ශනයේ ප්‍රගතිය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණය සම්පූර්ණයෙන්ම පාහේ නොමග යවා ඇත.

5.7.2 තවද අප ඉහත සඳහන් කල ආකාරයට නඩු භාණ්ඩවල අනන්‍යතාවය සම්බන්ධයෙන්ද මෙම සාක්ෂිකරු වගකීම් විරහිත ලෙස ක්‍රියා කර ඇත. තම අධීක්ෂණයේ දුර්වලතාවයක් සිදුවී ඇති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස නඩු භාණ්ඩ සළකුණු කිරීම සම්බන්ධයෙන් ව්‍යාකූල තත්ත්වයක් උද්ගත වී ඇති බවත් මෙම සාක්ෂිකරු සිය සාක්ෂියේදී ප්‍රකාශිතවම පිළිගෙන ඇත.

5.7.3 ඉහත කරුණු අනුව පැහැදිලිව පෙනී යන්නේ ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියගේ සාක්ෂිය විශ්වසනීයත්වයෙන් තොර බවත්, ඔහුගේ සාක්ෂිය මත විශ්වාසය තබා ක්‍රියා කිරීමේ කිසිදු හැකියාවක් මෙම අධිකරණයට නොමැති බවත්ය.

## 6. <u>ඉහත සාක්ෂි විශ්ලේෂණය මගින් පැමිණිල්ලේ නඩුව පිළිබඳ නිගමනයන්ට එළඹීම</u>

6.1 ඉහත විශ්ලේෂිත කරුණු අනුව පෙනී යන්නේ පැමිණිල්ලේ නඩුව විශ්වසනීය එකක් ලෙස සැලකීමේ හැකියාවක් මෙම අධිකරණයට නොමැති බවයි. මෙම සිද්ධිය පැමිණිල්ලේ සාක්ෂිකරුවන් පවසන ආකාරයට සිදුවූයේද නැතහොත්

වෙනත් ආකාරයකට සිදුවූයේද යන කරුණ සම්බන්ධයෙන් සාධාරණ සැකයක් ඇතිවීම වැලැක්විය නොහැක.

6.2 විශේෂයෙන්ම ඉහත විශ්ලේෂිත පහත සඳහන් කරුණු සමස්තයක් ලෙස සැලකීමේදී පැමිණිල්ල විසින් චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට අපොහොසත් වී ඇති බව පැහැදිලිව පෙනේ.

(a) වැටලීමට අදාල මුල් තොරතුර ලැබීම සහ චූදිතයන් අත්අඩංගුවට ගැනීම.

(b) ප්‍රධාන පොලිස් පරීක්ෂක සුබෝධගේ සාක්ෂියේ විශ්වසනීයත්වය.

(c) නඩු භාණ්ඩවල අනන්‍යතාවය සහ නඩු භාණ්ඩ දාමය.

(d) මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර ඇති ආකාරය සහ පැමිණිල්ලේ ප්‍රධාන සාක්ෂිකරුවන් දෙදෙනාගේ ප්‍රකාශ සටහන් කිරීමේදී සිදුවී ඇති ප්‍රමාදය.

(e) පොලිස් සැරයන් සමීර ධනුෂ්කගේ සාක්ෂියෙන් අනාවරණය වූ කරුණු.

(f) ඡායාරූප සාක්ෂි ලෙස ඉදිරිපත් නොකිරීම.

(g) ප්‍රධාන පොලිස් පරීක්ෂක හිරියාදෙණියගේ ක්‍රියා කලාපය සහ ඔහුගේ සාක්ෂියේ විශ්වසනීයත්වය.

6.3 පැමිණිල්ලේ නඩුව විශ්වසනීය එකක් ලෙස සැලකිය නොහැකි බවටත්, චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බවටත් මේ වන විට අප නිගමනයකට එළඹ ඇත. මෙම නිගමනයේ

ස්වභාවය අනුව විත්තියේ නඩුව සහ විත්තියේ ස්ථාවරය විශ්ලේෂණය කිරීමේ නීතිමය අවශ්‍යතාවයක් පැන නොනගින බව අපගේ අදහසයි. කෙසේ නමුත් විත්තියේ ස්ථාවරය පිළිබඳ අපගේ මතයද කෙටියෙන් මෙම තීන්දුවේ සඳහන් කිරීමට අදහස් කරමු.

## 7. විත්තියේ ස්ථාවරය

7.1 1 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී කපිතාන් දහනායකට යෝජනා කර ඇත්තේ මත් ද්‍රව්‍ය සොයා ගැනීමෙන් පසුව චූදිතයන් සිටි ධීවර යාත්‍රාව වෙත පැමිණ එම ධීවර යාත්‍රාව අත්අඩංගුවට ගත් බවයි. වෙනත් වචන වලින් පවසන්නේ නම් චූදිතයන් අත්අඩංගුවට ගත් අවස්ථාව වන විටත් සාගර නෞකාව තුළ මත් ද්‍රව්‍ය තොගය තිබී ඇත. කෙසේ නමුත් 1 වන චූදිත සිය සාක්ෂියේදී මේ බව කිසිසේත්ම සඳහන් කර නැත. ඒ අනුව පෙනී යන්නේ ඉහත කී යෝජනාව හුදෙක් පසු සිතිවිල්ලක් මත ගොතන ලද යෝජනාවක් බවයි.

7.2 3 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී කපිතාන් බෝවත්තට යෝජනා කරන ලද්දේ 2019.04.23 දින පාන්දර සාගර නෞකාවට ගොඩවූ නාවික හමුදා බුද්ධි අංශ නිලධාරීන් ඔවුන් පැමිණි යාත්‍රාවෙන් රැගෙන ආ ගෝනි 13 ක් සාගර නෞකාවට දැමූ බවයි. කෙසේ නමුත් 03 වන චූදිත සිය විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේ මෙවැන්නක් කිසිසේත්ම සඳහන් කර නැත. ඒ අනුව ඉහත කී යෝජනාවද අසත්‍ය ලෙස ගොතන ලද්දක් ලෙස සැලකීම හැර වෙනත් විකල්පයක් මෙම අධිකරණයට නැත.

7.3 විත්තිවාචකය නැතහොත් විත්තියේ ස්ථාවරය කෙතරම් දුර්වල වුවද අපරාධ නඩුවක චූදිතයෙකු වරදකරු කිරීමට නම් පැමිණිල්ලේ නඩුව කාවදින සුළු සහ විශ්වසනීය තත්ත්වයක පැවතීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවයකි. විත්තිවාචකය කෙතරම් අසාර්ථක වුවද එමගින් දුර්වල පැමිණිල්ලේ නඩුවක් කිසිසේත්ම ශක්තිමත් නොවන අතර අධිකරණය කිසි විටෙකත් එවන් අනුමිතියකට නොඑළඹිය යුතුය. විත්තිවාචකයේ අසාර්ථකත්වය හේතුකොටගෙන දුර්වල සහ දෙදරාගිය පැමිණිල්ලේ නඩුවක් කිසිසේත්ම ශක්තිමත් නොවන බව මනාව ස්ථාපිත වී ඇති පිළිගත් නීතියයි. පැමිණිල්ල සිය නඩුව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුතු අතර එම අනිවාර්ය අවශ්‍යතාවයෙන් මිදී යාමේ හැකියාවක් කිසිසේත්ම පැමිණිල්ලට නැත. මේ සම්බන්ධයෙන් **(2000) 3 ශ්‍රී ලංකා නීති වාර්තා 393 පිටුවේ සඳහන් කමල් අද්දරාරච්චි එදිරිව ජනරජය නඩුවේ ගරු හෙක්ටර් යාපා විනිසුරුතුමාගේ තීන්දුවේ** සඳහන් කරුණු විශේෂයෙන් වැදගත් වේ.

7.4 තවද මේ සම්බන්ධයෙන් ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද **Sunil Kundu v. State of Jharkhand (2013) 4 SCC 422** නඩුවේ තීන්දුවෙන් උපුටා දැක්වෙන පහත සඳහන් කොටස වැදගත් වේ.

> **"............When the prosecution is not able to prove its case beyond reasonable doubt it cannot take advantage of the fact that the accused have not been able to probabilize their defence. It is well settled that the prosecution must stand or fall on its**

**own feet. It cannot draw support from the weakness of the case of the accused, if it has not proved its case beyond reasonable doubt."**

7.5 අනෙක් අතට අපරාධ නඩුවක් විභාග කරන විනිසුරුවරයකුගේ කාර්ය භාරය වන්නේ වරදකාරීත්වය සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වූ චූදිතයන් වරදකරු කිරීම සහ වරදකාරීත්වය සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට අපොහොසත් වූ චූදිතයන් නිදොස් කිරීමයි. මේ සම්බන්ධයෙන් **(2012) 1 ශ්‍රී ලංකා නීති වාර්තා 60 පිටුවේ සඳහන් අබේසේකර එදිරිව නීතිපති නඩුවේ ගරු ගාමිණී අමරතුංග විනිසුරුතුමාගේ තීන්දුවේ** සඳහන් කරුණු විශේෂයෙන් වැදගත් වේ.

7.6 ඉහත කරුණු අනුව අපගේ නිගමනය වන්නේ එකිනෙකට පටහැනි විත්තියේ ස්ථාවරයන් මගින් දුර්වල සහ දෙදරා ගිය පැමිණිල්ලේ නඩුව කිසිසේත්ම ශක්තිමත් නොවන බයි.

8. <u>අවසන් නිගමනය</u>

8.1 ඉහත හේතු අනුව කිසිදු චූදිතයකුට එරෙහිව කිසිදු චෝදනාවක් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බව තීරණය කරමු. ඒ අනුව 01 සිට 05 දක්වා චූදිතයන් 1, 2, 3 චෝදනාවලින් නිදොස් කරමු.

**ඒ.කේ.එම්.පටබැඳිගේ**
**මහාධිකරණ විනිසුරු (සභාපති)**
**මහාධිකරණය - කොළඹ**
**2023.04.06**

**මංජුල තිලකරත්න**
**මහාධිකරණ විනිසුරු**
**මහාධිකරණය - කොළඹ**
**2023.04.06**

**එම්.ඩබ්.ජේ.කේ.වීරමන්**
**මහාධිකරණ විනිසුරු**
**මහාධිකරණය-කොළඹ**
**2023.04.06**